**විෂය** - ප්‍රායෝගික තාක්ෂණ කුසලතා

**ශ්‍රේණිය** - 8

**මාසය** - ජනවාරි **සතිය** - 04 **ක්‍රියාකාරකම් අංකය** - 04

**සැකසුම්- බී.ආර්.මහේෂිකා ගල්වත්ත,කලාප අධ්‍යාපන කාර්යාලය,ඇඹිලිපිටිය**

## 1. කෘෂිකර්මය

### 1.1 අභියෝග ජයගනිමින් ගෙවත්තක් සකසමු.

**ශිෂ්‍ය කාර්යය**

- ✓ ඔබගේ කියවීම් පොතෙහි පිටු අංක 12 සහ 13 හොඳින් කියවා තේරුම්ගන්න.
- ✓ අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු ගෙන් විමසා අවබෝධ කරගන්න.
- ✓ මෙහි පහත දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- ✓ නිවාස භූමියෙහි පවතින කෘෂිකාර්මික විභව සහ ගැටළු ප්‍රමුඛතාව අනුව පෙළගස්වන්න.
- ✓ ගෙවත්ත සකස් කිරීමේදී මුහුණ පෑමට සිදුවන ගැටළු හා ඒ සඳහා යොදා ගත හැකි විසඳුම් පිළබඳ සාරාංශයක් වගුවක ආකාරයෙන් සටහන් කරන්න
- ✓ ක්‍රියාකාරකම සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

**මෙම පාඩමට අදාළව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක**

- ✓ https://www.gwp.org/globalassets/global/gwp-sas_files/reports/home-gardening.pdf
- ✓ https://www.youtube.com/watch?v=6zG7hOpWCo8

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම් ඵල**

- ✓ ගෙවත්තක් සැකසීමේදී සැලකිලිමත් විය යුතු කරුණු විමසා බලයි.
- ✓ ගෙවත්තක් සැකසීමේදී මුහුණපෑමට සිදුවන ගැටළු දැනගනියි.
- ✓ එම ගැටළු සඳහා විසඳුම් සෙවීමේ නිරතවෙයි.
- ✓ ගෙවත්තේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා තාක්ෂණික ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය**

- ✓ ගෙවත්තක් සකස් කිරීමට අදාලව ව්‍යාපෘතියක් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන්න.(ලකුණු 20)